Advanced Level

CHEMISTRY

# Revision



# රසායනික ගණනය 01

**SASINTHA MADHUSHAN**(bsc. Sp)

**0712470326**

| පදනම් SI ඒකක | | |
|---|---|---|
| භෞතික රාශිය හා සංකේතය | ඒකකයේ නම | ඒකකයේ සංකේතය |
| දිග (l) | meter | m |
| ස්කන්ධය (m) | kilogram | kg |
| කාලය (t) | second | s |
| විද්‍යුත් ධාරාව (I) | ampere | A |
| තාපගතික උෂ්ණත්වය (T) | kelvin | K |
| ද්‍රව්‍ය ප්‍රමාණය (n) | mols | mol |
| දීප්ත තීව්‍රතාවය ($I_v$) | candela | cd |
| අනුපූරක SI ඒකක | | |
| තල කෝණය | radian | rad |
| ඝන කෝණය | steradian | sr |

| ව්‍යුත්පන්න SI ඒකක | |
|---|---|
| භෞතික රාශිය හා සංකේතය | ඒකකයේ සංකේතය |
| වර්ගඵලය (A) | $m^2$ |
| පරිමාව (V) | $m^3$ |
| ඝණත්වය (d/ρ) | $kg\ m^{-3}$ |
| ප්‍රවේගය (v) | $m\ s^{-1}$ |
| සාන්ද්‍රනය (c) | $mol\ m^{-3}$ |
| ගම්‍යතාවය (p) | $kg\ m\ s^{-1}$ |
| මවුලික ස්කන්ධය (M) | $kg\ mol^{-1}$ |
| මවුලික පරිමාව ($V_m$) | $m^3\ mol^{-1}$ |

| විශේෂ නම් සහිත ව්‍යුත්පන්න SI ඒකක | | | |
|---|---|---|---|
| භෞතික රාශිය හා සංකේතය | ඒකකයේ නම | ඒකකයේ සංකේතය | ව්‍යුත්පන්න SI ඒකකය |
| බලය | නිව්ටන් | N | $1\ N = 1 kg\ m\ s^{-1}$ |
| පීඩනය | පැස්කල් | Pa | $1\ Pa = 1\ N\ m^{-2}$ |
| ශක්තිය | ජූල් | J | $1\ J = 1 kg\ m^2\ s^{-1}$ |
| විද්‍යුත් ප්‍රමාණය | කූලෝම් | C | 1 C = 1 A s |
| විද්‍යුත් ධාරිතාව | ෆැරඩ් | F | 1 F = 96490 C |
| සංඛ්‍යාතය | හර්ට්ස් | Hz | $1\ Hz = 1\ s^{-1}$ |
| සෙල්සියස් උෂ්ණත්වය | සෙල්සියස් | $^0C$ | $1\ ^0C = 1\ K$ |

| ගුණාකාරයෝ | | |
|---|---|---|
| $10^1$ | deca | da |
| $10^2$ | hecta | h |
| $10^3$ | kilo | k |
| $10^6$ | mega | M |
| $10^9$ | giga | G |
| $10^{12}$ | tera | T |
| $10^{15}$ | peta | P |

| | | |
|---|---|---|
| $10^{-1}$ | deci | d |
| $10^{-2}$ | centi | c |
| $10^{-3}$ | milli | m |
| $10^{-6}$ | micro | μ |
| $10^{-9}$ | nano | n |
| $10^{-12}$ | pico | p |
| $10^{-15}$ | femto | f |

සංයෝග හා අයන SI නාමකරණය

| විචල්‍ය ඔක්සිකරණ අංක නොමැති ලෝහ අයන නාමකරනයේදී ලෝහයේ නාමයම අයනයටද යොදයි. | | | |
|---|---|---|---|
| සංඛේතය | නම | සංඛේතය | නම |
| $H^+$ | Hydrogen ion | $Cs^+$ | Cisium ion |
| $Na^+$ | Sodium ion | $Ag^+$ | Silver ion |
| $Li^+$ | Lithium ion | $NH_4^+$ | Ammonium ion |
| $K^+$ | Potassium ion | | |

| විචල්‍ය ඔක්සිකරණ අංක ඇති ලෝහ අයන නාමකරනයේදී අඩු ඔක්සිකරණ අංකය සහිත අයනයට “us” ප්‍රත්‍ය ද වැඩි ඔක්සිකරණ අංකය සහිත අයනයට “ic” ප්‍රත්‍ය ද යොදයි. | | | |
|---|---|---|---|
| සංඛේතය | නම | සංඛේතය | නම |
| $Cu^+$ | Cupper (I) /Cuprus ion | $Pb^{2+}$ | Lead(II) /Plumbous ion |
| $Cu^{2+}$ | Cupper (II) /Cupric ion | $Pb^{4+}$ | Lead(IV) /Plumbic ion |
| | | | |
| $Fe^{2+}$ | Iron (II) /Ferrous ion | $Sn^{2+}$ | Tin(II) / Stanous ion |
| $Fe^{3+}$ | Iron (III) /Ferric ion | $Sn^{4+}$ | Tin(IV) /Stanic ion |
| | | | |
| $Hg_2^{2+}$ | Mercury(I) /Mercurous ion | | |
| $Hg^{2+}$ | Mercury(I)I /Mercuric ion | | |

| සරල ඇනායන ප්‍රත්‍යයෙන් “ide” ද විචල්‍ය ඔක්සිකරණ අංක ඇති ඇනායන නාමකරනයේදී අඩු ඔක්සිකරණ අංකය සහිත අයනයට “ite” ප්‍රත්‍ය ද වැඩි ඔක්සිකරණ අංකය සහිත අයනයට “ate” ප්‍රත්‍ය ද යොදයි. | | | |
|---|---|---|---|
| සංඛේතය | නම | සංඛේතය | නම |
| $F^-$ | Fluoride ion | $P^{3-}$ | Phosphide ion |
| $Cl^-$ | Chloride ion | $OH^-$ | Hydroxide ion |
| $Br^-$ | Bromide ion | $CN^-$ | Cyanide ion |
| $I^-$ | Iodide ion | | |
| | | | |
| $O^{2-}$ | Oxide ion | $N^{3-}$ | Nitride ion |
| $O_2^{2-}$ | Peroxide ion | ${NO_2}^-$ | Nitrate(III)/ Nitrite ion |
| $O_2^-$ | Superoxide ion | ${NO_3}^-$ | Nitrate(V)/ Nitrate ion |
| | | | |
| $S^{2-}$ | Sulphide ion | ${CO_3}^{2-}$ | Carbonate(VI) / Carbonate ion |
| $HS^-$ | Bisulphide ion | ${HCO_3}^-$ | bicarbonate / hydrogen carbonate ion |
| ${SO_3}^{2-}$ | Sulphate(IV)/Sulphite ion | | |
| ${HSO_3}^-$ | bisulphite/hydrogen sulphite ion | ${MnO_4}^-$ | Manganate(VII) /permanganate ion |
| ${SO_4}^{2-}$ | Sulphate(VI)/Sulphate ion | ${MnO_4}^{2-}$ | Manganate(VI) /Manganate ion |
| ${HSO_4}^-$ | bisulphate/hydrogen sulphate ion | | |

සිද්ධාන්ත පුනරීක්ෂණය සඳහා මෙම ගැටලු පලමුව විසඳාලීමට උත්සහ කරන්න

## සාපේක්ෂ පරමාණුක ස්කන්ධය

පරමාණු වල ස්කන්ධය $10^{-24}\ g$ සිට $10^{-22}\ g$ පරාසයේ වේ.

$$\text{සාපේක්ෂ පරමාණුක ස්කන්ධය} = \frac{\text{පරමාණුවේ ස්කන්ධය}}{{}^{12}_{6}\text{C සමස්ථානිකයේ පරමාණුවක ස්කන්ධය} \times \frac{1}{12}}$$

$$\text{සාපේක්ෂ අණුක ස්කන්ධය} = \frac{\text{අණුවේ ස්කන්ධය}}{{}^{12}_{6}\text{C සමස්ථානිකයේ පරමාණුවක ස්කන්ධය} \times \frac{1}{12}}$$

පරමාණුක ස්කන්ධය ඒකකය (atomic mass unit) $= {}^{12}_{6}\text{C}$ සමස්ථානිකයේ පරමාණුවක ස්කන්ධය $\times \frac{1}{12}$

| සමස්ථානිකය | සා.ප.ස් | සාපේක්ෂ සුලබතාවය % |
|---|---|---|
| $L$ | $M_1$ | $x_1$ |
| $M$ | $M_2$ | $x_2$ |
| $N$ | $M_3$ | $x_3$ |

$$\text{මධ්‍යන්‍ය සා. ප. ස්.} = \frac{M_1x_1 + M_2x_2 + M_3x_3}{100}$$

1. ${}^{12}_{6}$C සමස්ථානිකයේ පරමාණු $6.022 \times 10^{23}$ ක ස්කන්ධය 12. 00g නම්, පරමාණුක ස්කන්ධය ඒකකයේ (a. m. u) අගය සොයන්න.

2. Ca පරමාණුවක ස්කන්ධය $6.64 \times 10^{-23}$ g වේ නම් Ca හි සාපේක්ෂ පරමාණුක ස්කන්ධය (සා.ප.ස්) සොයන්න

3. X පරමාණුවක ස්කන්ධය $13.22 \times 10^{-26}$ kg වේ. X හි සා. ප. ස්. සොයන්න.

4. A පරමාණුවක ස්කන්ධය ${}^{12}_{6}$C සමස්ථානිකයේ ස්කන්ධය මෙන් 8 ගුණයක් වේ නම් A හි සා. ප. ස්. සොයන්න.

5. Pb හි සා.ප.ස් 207 නම්, Pb පරමාණුවක ස්කන්ධය සොයන්න.

6. Mg පරමාණුවක ස්කන්ධය $4.037 \times 10^{-23}$ g වන අතර ${}^{12}_{6}C$ පරමාණුවක ස්කන්ධය $1.993 \times 10^{-23}$ g වේ නම් Mg හි සාපේක්ෂ පරමාණුක ස්කන්ධය (සා.ප.ස්) සොයන්න

7. Mg හි සමස්ථානික වල තොරතුරු පහත දැක්වේ. එමගින් Mg හි සා.ප.ස් මධ්‍යක අගය සොයන්න

| සමස්ථානික | සා.ප.ස් | සාපේක්ෂ සුලබතාවය % |
|---|---|---|
| ${}^{24}_{12}$Mg | 24 | 78 |
| ${}^{25}_{12}$Mg | 25 | 12 |
| ${}^{26}_{12}$Mg | 26 | 10 |

8. ස්වාභාවික පවතින ක්ලෝරීන් $^{35}_{17}Cl$, $^{37}_{17}Cl$ යන සමස්ථානික දෙකකින් යුක්ත වේ. ඒවායේ සාපේක්ෂ පරමාණුක ස්කන්ධ හා සාපේක්ෂ සුලබතාවය පිළිවෙලින් 35.0, 37.0 හා 75.8%, 24.2% නම් Cl හි සාපේක්ෂ පරමාණුක ස්කන්ධය (සා.ප.ස්) සොයන්න.

## මවුලය

යම් සංඝටකයක, $^{12}_{6}C$ සමස්ථානිකයේ හරියටම 12.00 g ක අඩංගු පරමාණුක සංඛ්‍යාවට සමාන සංඝටකයකයේ ප්‍රමාණයට මවුලයක් (mol) යැයි කියනු ලැබේ.

මවුලයක ඇති පදාර්ථ ප්‍රමාණය ඇවගාඩ්රෝ නියතය ලෙස හඳුන්වනු ලැබේ.

ඇවගාඩ්රෝ නියතය $= 6.022 \times 10^{23}\ mol^{-1}$

ද්‍රව්‍ය ප්‍රමාණයක ඇති අංශු සංඛ්‍යාව

$$N = nL$$

$N =$ අංශු සංඛ්‍යාව
$n =$ ද්‍රව්‍ය ප්‍රමාණය
$L =$ ඇවගාඩ්රෝ නියතය $6.022 \times 10^{23}\ mol^{-1}$

යම් ස්කන්ධයක ඇති ද්‍රව්‍ය ප්‍රමාණය

$$n = \frac{m}{M}$$

$n =$ ද්‍රව්‍ය ප්‍රමාණය
$m =$ ද්‍රව්‍ය ස්කන්ධය
$M =$ මවුලික ස්කන්ධය

9. පහත සංයෝග වල සා. අ. ස්. සොයන්න.

| | | | | |
|---|---|---|---|---|
| $NaOH$ | $KCl$ | $MgO$ | $Ca(OH)_2$ | $(NH_4)_2CO_3$ |
| $CuSO_4$ | $CuSO_4.5H_2O$ | $(NH_4)_2Cr_2O_7$ | $Mg(HCO_3)_2$ | $C_{12}H_{22}O_{11}$ |

(Na- 23, O=16, H=1, K=39, Cl=35.5, Mg=24, Ca=40, N=14, C=12, Cu=64, S=32, Cr=52)

10. පහත සංයෝග වල මවුලික ස්කන්ධය සොයන්න.

| | | | | |
|---|---|---|---|---|
| $KOH$ | $K_4Fe(CN)_6$ | $FeO$ | $Al(OH)_3$ | $NH_4Fe(SO_4)_2.12H_2O$ |
| $CuSO_3$ | $Na_2CO_3.10H_2O$ | $(NH_4)_3PO_4$ | $Al_2(CO_3)_3$ | $C_6H_{12}O_6$ |

(Fe- 56, Al=27, P=31)

11. පහත සංඝටක වල ස්කන්ධය සොයන්න.

| | |
|---|---|
| $Mg^{2+}$ 3 mol ක | $CO_2$ 2 mol ක |
| O පරමාණු 0.25 mol ක | $H_2SO_4$ 10 mol ක |
| $O_2$ අණු 0.5 mol ක | NaCl 3 mol ක |

S පරමාණු 0.75 mol ක

$S_8$ අණු 0.75 mol ක

$Ca(OH)_2$ 0.75 mol ක

$C_{12}H_{22}O_{11}$ 0.5 mol ක

12. පහත සංඝටක වල මවුල ගනන සොයන්න.

Pb 69 g ක

Fe 14 g ක

$N_2$ 56 g ක

Hg 16 g ක

Al 0.9 g ක

$CaC_2O_4$ 25.6 g ක

$Na_2CO_3$ 5.3 g ක

$CaCO_3$ 0.25 g ක

$C_{12}H_{22}O_{11}$ 9 g ක

$Na_2CO_3.10H_2O$ 5.72 g ක

(Pb- 207, Ag=108, Hg=200)

13. පහත මුලද්‍රවH ස්කන්ධ වල පරමාණු සංඛHාව සොයන්න.

Ca $3.011 \times 10^{-3}$ g ක

Ar $12.044 \times 10^{-3}$ g ක

Hg 12 g ක

(Ar=40)

14. සජල සෝඩියම් කාබනේට් [$Na_2CO_3.6H_2O$] හි මෞලික ස්කන්ධය ගනනය කරන්න.
(Na=23, O=16, C=12, H=1)

15. පොටෑෂ් ඇලම් [$K_2SO_4.Al_2(SO_4)_3.24H_2O$] වල මෞලික ස්කන්ධය ගනනය කරන්න.
(K=39, O=16, Al=27, H=1, S=32)

## සංයුතිය ප්‍රකාශ කළ හැකි විවිධ ආකාර

$$\text{ස්කන්ධ භාගය} = \frac{\text{සංඝටකයේ ස්කන්ධය}}{\text{මුළු ස්කන්ධය}}$$

$$\text{පරිමා භාගය} = \frac{\text{සංඝටකයේ පරිමාව}}{\text{මුළු පරිමාව}}$$

$$\text{මවුල භාගය} = \frac{\text{සංඝටකයේ මවුල ගනන}}{\text{මුළු මවුල ගනන}}$$

A හා B මිශ්‍රණයක දී,

$$\text{A ස්කන්ධ භාගය} = \frac{\text{A ස්කන්ධය}}{\text{A ස්කන්ධය + B ස්කන්ධය}}$$

$$\text{A පරිමා භාගය} = \frac{\text{A පරිමාව}}{\text{A හා B මුළු පරිමාව}}$$

$$\text{A මවුල භාගය} = \frac{\text{A මවුල ගනන}}{\text{A මවුල ගනන + B මවුල ගනන}}$$

16. පහත සංයෝග වල එක් එක් මුලද්‍රව්‍යHfha ialkaO m%;sY; fidhkak.

$Mg_3N_2$ $\qquad$ $C_6H_5COOH$

$Na_2B_4O_7$ $\qquad$ $HClO_4$

17. පහත සංයෝග වල පවතින එක් එක් මූලද්‍රව්‍යයේ ස්කන්ධය අනුව ප්‍රතිශතය දක්වන්න
(N=14, O=16, C=12, H=1)

යූරියා (Urea)
$H_2N - CO - NH_2$

බියුටනොයික් අම්ලය (Butanoic acid)
$CH_3 - CH_2 - CH_2 - COOH$

ටොලුවීන් (Toluene)
($C_7H_8$)




ග්ලූකෝස් (Glucose)
$C_6H_{12}O_6$

**අණුක සූත්‍රය** - සංයෝගයක අණුවක ඇති ඒ ඒ මූලද්‍රව්‍ය පරමාණු සංඛ්‍යාව නියම වශයෙන් පෙන්නුම් කරන සූත්‍රය.

**ආනුභවික සූත්‍රය** - සංයෝගයක සංයුතිය හා එකඟ වන පරිදි වූ ඒ ඒ පරමාණු සංඛ්‍යා අතර සරල ම පූර්ණ සංඛ්‍යාත්මක අනුපාතය පෙන්නුම් කරන සූත්‍රය.

$$n = \frac{\text{අණුක සූත්‍ර ස්කන්ධය}}{\text{ආනුභවික සූත්‍ර ස්කන්ධය}}$$

අණුක සූත්‍රය = (ආනුභවික සූත්‍රය)$_n$
n=1, 2, 3,.........

18. පහත ප්‍රමාණාත්මක දත්ත උපයෝගී කර ගෙන සංයෝග වල ආනුභවික සූත්‍ර නිර්නය කරන්න.

27.3% C, 72.7% O

29.1% Na, 40.5% S, 30.4%O

32.4% Na, 22.6% S, 45.0%O

Mg 10.8 g ක් එහි ඔක්සයිඩය 18.0 g ක් සාදයි

Ca 3.40 g ක් එහි ක්ලෝරයිඩය 9.435 g ක් සාදයි

Fe 3.528 g ක් එහි ක්ලෝරයිඩය 10.237g ක් සාදයි

19. සංයෝගයක 42.6% කාබන් ද, 3.6% හයිඩ්‍රජන් ද, 23.1% ඔක්සිජන් ද, නයිට්‍රජන් ද පමනක් පවතී. සංයෝගයේ මවුලික ස්කන්ධය 200 g mol$^{-1}$ පමන වේ නම්, සංයෝගයේ අණුක සූත්‍රය සොයන්න.

20. A නම් සංයෝගයක 35.5% කාබන් ද, 3.4% හයිඩ්‍රජන් ද, 40.7% සල්ෆර් ද, ඔක්සිජන් ද පමනක් පවතී. සංයෝගයේ සා. අ. ස්. 200 පමන වේ නම්, සංයෝගයේ අණුක සූත්‍රය සොයන්න.

21. P නැමැති කාබනික සංයොගයේ කාබන් 47.4%, හයිඩ්‍රජන් 2.63%, නයිට්‍රජන් 18.4%, සහ ඔක්සිජන් පමණක් තිබේ. P හි සා.ප.ස් 150 පමණ වේ නම්, අණුක සූත්‍රය සොයන්න. (N=14, O=16, C=12, H=1)

22. C, H, O පමණක් අඩංගු සංයෝගයක C 40% ක් හා H 6.67% පවතී. මීට අමතරව O පමණක් අඩංගු වේ. සංයෝගයේ මවුලික ස්කන්ධය 182 g $mol^{-1}$ පමණ වේ නම්, සංයෝගයේ අණුභාවික හා අණුක සූත්‍ර සොයන්න. (O=16, C=12, H=1)

23. C, H, O පමණක් ඇති Y කාබනික සංයෝගය පූර්න දහනයට ලක් කල විට $CO_2$ සහ $H_2O$, 2:1 යන මවුල අනුපාතයෙන් ලැබේ. Y හි නිරවද්‍ය මවුලික ස්කන්ධය 152 g $mol^{-1}$ වේ. Y හි ඇති O ප්‍රතිශතය 40% ට අඩු නම් Y හි අණුක සූත්‍රය සොයන්න. (O=16, C=12, H=1)

24. $O_3$ (ඕසෝන්), ඔක්ෂිජන් හි එක් බහුරූපී ආකාරයක් වේ. ඕසෝන් 24 g ක් තුල අන්තර්ගත වන

I. $O_3$ අණු ගණන
II. සංයොජිත O පරමාණු ගණන
III. සාම්පලයේ මුලු ඉලෙක්ට්‍රෝන ගණන සොයන්න. (O = 16)

25. $(NH_4)_2Cr_2O_7$ සාම්පලයකින් 5.04 g ප්‍රමාණයක් ඔබට සපයා ඇත .

I. $NH_4^+$ හා $Cr_2O_7^{2-}$ මවුල ප්‍රමාණය සොයන්න.
II. ඉහත $(NH_4)_2Cr_2O_7$ ප්‍රමාණය සම්පූර්ණයෙන්ම තාප වියෝජනය කලේ නම් ඉතිරි වන ඝණයේ ස්කන්ධය සොයන්න. (N=14, O=16, Cr=52, H=1)

26. රොම්බසීය සල්පර් $S_8$ ලෙස පවතී. සල්පර් 3.2g ප්‍රමාණයක් ලබා දී ඇත .

I. සාම්පලයේ $S_8$ අණු ගණන සොයන්න.
II. ඉහත සල්පර් සියල්ලම $SO_2$ බවට පත්කිරීමට අවශ්‍ය $O_2$ ස්කන්ධය සොයන්න.
III. විද්‍යාගරයේදී $O_2$ නිපදවිය හැකි ක්‍රම රසායණ සමිකරණ ඇසුරෙන් දෙන්න. (S=32, O=16)

27. සුදු පොස්පරස් ස්වාභාවිකව $P_4$ අණු ලෙස පවති. $P_4$, 124 g ක් සපයා ඇත.

I. සාම්පලයේ $P_4$ මවුල ප්‍රමාණය
II. සාම්පලයේ $P_4$ අණු ගනන
III. සාම්පලයේ P-P බන්ධන ගනන
IV. සාම්පලයේ සංයෝජිත P පරමාණු ගනන
V. සාම්පලයේ මුළු ඉලෙක්ට්‍රෝන ගනන

ගණනය කරන්න. (P = 32)

28. propane($C_3H_8$) 22.4 g ක් තුල අන්තර්ගත වන

I. සාම්පලයේ $C_3H_8$ මවුල ප්‍රමාණය
II. සාම්පලයේ $C_3H_8$ අණු ගනන
III. සංයෝජිත මුළු පරමාණු ගනන
IV. $C - H$ මුළු බන්ධන ගනන

ගණනය කරන්න.

29. නිෂ්ක්‍රීය පරිසරයක් තුලදී X නම් වු අකාබනික ලවණය පූර්ණ තාප විඝටනයෙන් $Cr_2O_3$ 1.52g, $N_2$ 0.28g සහ $H_2O$ 0.72g යන එල පමණක් ලබා දෙයි. (H=1, N=14, O=16, Cr=52)

I. X හි ආනුභවික සූත්‍රය අපෝහනය කරන්න.
II. X මවුලයක Cr මවුල දෙකක් අන්තර්ගතය. සංයෝගයේ $H_2O$ අණු අන්තර්ගත වී නොමැත. X හි අඩංගු කැටායනය සහ ඇනයනය සදහන් කරන්න.
III. X හි රසායනික සූත්‍රය ලියන්න.

30. $Na_2CO_3 . x H_2O$, ස්ඵටික ජලය සහිත කාබනේටයක 11.3 g ක් රත් කල විට ස්කන්ධය අඩුවීම 7.2 g වේ. x හි අගය සොයන්න. (Na=23, C=12, O=16, H=1)

31. ජලය 54 g ක් හා ඇල්කොහොලය 2.5 mol අඩංගු මිශ්‍රණයක ජලයේ හා ඇල්කොහොල වල මවුල භාග සොයන්න.

32. එතනෝල් ($C_2H_5OH$) 22.5 g ක් හා ජලය 77.5 g ක් අඩංගු මිශ්‍රණයක ජලයේ හා එතනෝල් වල මවුල භාග සොයන්න.

33. කාමර උෂ්ණත්වයේදී $CO_2$ වායුවේ ඝණත්වය 1.78 g $cm^{-3}$ වේ. $CO_2$ වායු ඝනමිලිමීටරයක අඩංගු අණු සංඛ්‍යාව සොයන්න. (C=12, O=16)

34. රත්‍රන් හා තඹ මිශ්‍ර ලෝහයක වල රත්‍රන් ස්කන්ධ භාගය 0.75 කි. එහි රත්‍රන් වල මවුල භාගය සොයන්න. (Cu=63.5, Au=197)

## සංයුතිය ප්‍රකාශ කළ හැකි තවත් ආකාර

ද්‍රාව්‍යය - ද්‍රාවණයේ අඩු මවුල ප්‍රමාණයක් ඇති සංඝටකය/සංඝටක

ද්‍රාවකය - ද්‍රාවණයේ වැඩි මවුල ප්‍රමාණයක් ඇති සංඝටකය

ද්‍රාවණය - ද්‍රාව්‍යය + ද්‍රාවකය

$$C = \frac{n}{v}$$

C = සාන්ද්‍රනය / මවුලිකතාවය $mol\ dm^{-3}$
n = ද්‍රාව්‍යය මවුල ප්‍රමාණය $mol$
v = ද්‍රාවණ පරිමාව $dm^3$

$$d = \frac{m}{v}$$

C = ඝනත්වය $mol\ m^{-3}$
m = ස්කන්ධය $kg$
v = පරිමාව $m^3$

35. පහත ද්‍රාවණ වල සාන්ද්‍රන සොයන්න.
    I. NaOH 4.0 g ක් අඩංගු 500 $cm^3$ ක පරිමාවක් සහිත ද්‍රාවණයේ
    II. $Ca(OH)_2$ 7.4 g ක් අඩංගු 5 $dm^3$ ක පරිමාවක් සහිත ද්‍රාවණයේ
    III. $H_2SO_4$ 49.0 g ක් අඩංගු 2.5 $dm^3$ ක පරිමාවක් සහිත ද්‍රාවණයේ
    IV. HCl 73 g ක් අඩංගු 250 $cm^3$ ක පරිමාවක් සහිත ද්‍රාවණයේ

36. පහත ද්‍රාවණ වල ද්‍රාව ස්කන්ධය සොයන්න.
    I. 0.25 mol $dm^{-3}$ NaOH , 500 $cm^3$ ක පරිමාවක
    II. 0.20 mol $dm^{-3}$ HCl , 250 $cm^3$ ක පරිමාවක
    III. 0.20 mol $dm^{-3}$ $H_2SO_4$ , 2.5 $dm^3$ ක පරිමාවක
    IV. 0.25 mol $dm^{-3}$ KOH , 10 $cm^3$ ක පරිමාවක

37. NaOH 20 g ක් ජලයේ දියකර ගෙන සදාගත් ද්‍රාවණයේ මුලු පරිමාව 250 $cm^3$ නම්, ද්‍රාවණයේ NaOH සාන්ද්‍රනය ගණනය කරන්න.

38. NaCl 18.5 g ජලයේ දියකර ගෙන සදාගත් ද්‍රාවණයේ මුලු පරිමාව 885 $cm^3$ නම්, ද්‍රාවණයේ සාන්ද්‍රනය ගනනය කරන්න.

39. සාන්ද්‍රණය 0.14 moldm$^{-3}$ වු $C_6H_{12}O_6$ ද්‍රාවණයකින් 2.8 dm$^3$ ක් පිලියෙල කර ගැනිමට අවශ්‍ය වන $C_6H_{12}O_6$ වල ස්කන්ධය කොපමනද?

40. නිර්ජල $Na_2CO_3$ 42.4 g ක් ජලයේ දියකර ගෙන සදාගත් ද්‍රාවණයේ මුලු පරිමාව 250 cm$^3$ නම්, ද්‍රාවණයේ $Na^+$, $CO_3^{2-}$ සාන්ද්‍රනය ගණනය කරන්න.
ඉහත ද්‍රාවණය සැදිමට $Na_2CO_3 . 10\,H_2O$ භාවිත කලේ නම් අවශ්‍ය ස්කන්ධය ගණනය කරන්න.

41. $Na_2CO_3 . 10\,H_2O$ 57.2 g ප්‍රමාණයක් ජලයේ දිය කර මුලු පරිමාව 250 cm$^3$ දක්වා වැඩිකරන ලදි.

I. ජලීය ද්‍රාවණයේ $Na_2CO_3$ සාන්ද්‍රණය ගණනය කරන්න.
II. ඉහත ද්‍රාවණය සැදිමට නිර්ජලීය $Na_2CO_3$ භාවිත කලේ නම්, අවශ්‍ය ස්කන්ධය ගණනය කරන්න.
(Na=23, C=12, O=16, H=1)

*42.* $FeSO_4 . (NH_4)_2SO_4 . 6\,H_2O$ ලවණයෙන් 19.6 g ක් ආස්‍රැත ජලයේ දියකර මුලු පරිමාව 500 cm$^3$ වන ද්‍රාවණයක් සාදාගනි. එම ද්‍රාවණයේ $Fe^{2+}, NH_4^+, SO_4^{2-}$ ඒවායේ සාන්ද්‍රණ සොයන්න.
(Fe=56, N=14, O=16, H=1, S=32)

43. කාමර උෂ්ණත්වයේ දී ජලයේ ඝණත්වය 0.996 g cm$^{-3}$ නම් ජලයේ $H_2O$ සාන්ද්‍රණය සොයන්න

44. 12 mol dm$^{-3}$ සාන්ද්‍ර HCl ද්‍රාවණයක් විද්‍යාගාරයේ ඇත . මෙම ද්‍රාවණය භාවිතා කර 2 mol dm$^{-3}$ සාන්ද්‍රනයෙන් යුත් 250 cm$^3$ ක පරිමා කොටස් 20 ක් සදාගන්නේ කෙසෙ ද?

45. $Na_2CO_3$ විද්‍යාගාර ප්‍රථමික සම්මතයක් (primary standard substance) ලෙස යොදාගත හැක්කේ ඇයි දැයි පැහැදිලි කරන්න.
0.02 mol dm$^{-3}$ සාන්ද්‍රනයෙන් යුත් ජලීය $Na_2CO_3$ ද්‍රාවණ 250 cm$^3$ ක් සාදාගන්නා ආකාරය ලියන්න.

46. 2 mol dm$^{-3}$ $HNO_3$ ද්‍රාවණ 10 cm$^3$ ක් ගෙන අවශ්‍ය පමනට ආස්‍රැත ජලය යොදා 0.25 mol dm$^{-3}$ $HNO_3$ ද්‍රාවණයක් පිලියෙල කරගෙන ඇත. මෙම අවසාන ද්‍රාවණයේ පරිමාව කොපමණ ද?

47. 2 mol dm$^{-3}$ HCl ද්‍රාවණයකින් ආරම්භ කරමින් 0.25 mol dm$^{-3}$ HCl , 250 cm$^3$ ක් සැදිම සඳහා අවශ්‍ය කරන HCl මුල් පරිමාව සොයන්න.

48. 1.00 moldm$^{-3}$ NaOH ද්‍රාවණ 10 cm$^3$ ක් යොදා ගෙන 0.25 moldm$^{-3}$ NaOH ද්‍රාවණයකින් කොපමණ පරිමාවක් පිලියෙල කරගත හැකිද? (Na=23, O=16, H=1)

49. 1.00 moldm$^{-3}$ NaOH ද්‍රාවණයකින් ආරම්භ කරමින් 0.25 moldm$^{-3}$ NaOH, 500 cm$^3$ ක් සැදිම සඳහා අවශ්‍ය කරන මුල් පරිමාව සොයන්න. (Na=23, O=16, H=1)

50. 2.5 mol dm$^{-3}$ HCl හා 4 mol dm$^{-3}$ HCl ද්‍රාවණ සපයා ඇත. මෙම ද්‍රාවණ පමණක් උපයෝගි කරගෙන 3.25 mol dm$^{-3}$ HCl ද්‍රාවණයකින් 400 cm$^3$ ක් සාදාගන්නේ කෙසේ ද?

51. 0.5 mol dm$^{-3}$ HCl හා 0.25 mol dm$^{-3}$ $H_2SO_4$ ද්‍රාවණ ඔබට සපයා ඇත. මෙම ද්‍රාවණ පමණක් උපයෝගි කරගෙන $H^+$ අයන සාන්ද්‍රණය 0.25 mol dm$^{-3}$ වන ද්‍රාවණයකින් 500 cm$^3$ ක් සාදාගන්නේ කෙසේ ද?

52. විද්‍යාගාරයේ ඇති $HNO_3$ බෝතල් ලේබලයේ පහත තොරතුරු ඇත.
ද්‍රාවණයේ ඝණත්වය - 1.45 g cm$^{-3}$ ස්කන්ධය අනුව $HNO_3$ ප්‍රතිශතය - 63.03%
ද්‍රාවණයේ $HNO_3$ සාන්ද්‍රණය සොයන්න.

53. විද්‍යාගරයේ ඇති HCl බෝතල් ලේබලයේ පහත තොරතුරු ඇත.
ද්‍රාවණයේ ඝණත්වය - 1.18 g cm$^{-3}$ ස්කන්ධය අනුව HCl ප්‍රතිශතය - 36.48%

ද්‍රාවණයේ $HCl$ සාන්ද්‍රණය සොයන්න. (Cl=35.5, H=1)

54. විද්‍යාගරයේ ඇති $HNO_3$ බෝතල් ලේබලයක් පහත දක්වා ඇත. ද්‍රාවණයේ $HNO_3$ සාන්ද්‍රණය සොයන්න. (Cl=35.5, H=1)




55. විද්‍යාගරයේ ඇති $H_2SO_4$ බෝතල් ලේබලයේ පහත තොරතුරු ඇත.

| | |
|---|---|
| sp.gr =1.84 g cm$^{-3}$ | Assay – min 98% |
| M= 98 g mol$^{-1}$ | ***SULPHURIC ACID*** |

ද්‍රාවණයේ $H_2SO_4$ සාන්ද්‍රණය සොයන්න. (S=32, O=16, H=1)

56. විද්‍යාගරයේ ඇති $NH_3$ බෝතල් ලේබලයේ පහත තොරතුරු ඇත.
ද්‍රාවණයේ ඝණත්වය - 0.89 g cm$^{-3}$ ස්කන්ධය අනුව $NH_3$ ප්‍රතිශතය - 17.03%
ද්‍රාවණයේ $NH_3$ සාන්ද්‍රණය සොයන්න. (N=14, H=1)

57. සාන්ද්‍ර හයිඩ්‍රොක්ලෝරික් අම්ලයේ ස්කන්ධය අනුව HCl ප්‍රතිශතය 36% වේ. සාන්ද්‍ර ද්‍රාවණයේ ඝණත්වය 1.18 g cm$^{-3}$ නම් සාන්ද්‍රනය 0.1 moldm$^{-3}$ වු තනුක අම්ල ද්‍රාවණ 500 cm$^3$ ක් පිළියෙල කිරීමට සාන්ද්‍ර අම්ලයෙන් කොපමන පරිමාවක් අවශ්‍යවේ ද? (Cl=35.5, H=1)

58. විද්‍යාගාරයේ ඇති $NH_3$ බෝතල් ලේබලයේ පහත තොරතුරු ඇත. ද්‍රාවණයේ $NH_3$ සාන්ද්‍රණය සොයන්න.

2.5 LITS
Ammonia solution
sp.gr =0.89 g cm$^{-3}$
**$NH_3$**
Assay = about 30%
M.W= 17.03

59. $'880\ ammonia'$ (ද්‍රාවණයෙ ඝණත්වය $0.880\ g\ cm^{-3}$) ලෙස ලේබලයේ සටහන් කර ඇති ඇමෝනියා ද්‍රාවණයේ $1\ dm^{-3}$ ක ඇමෝනියා $245\ g$ ක් අන්තර්ගත වේ. $2\ \text{mol dm}^{-3}$ ඇමෝනියා ද්‍රාවණ $2\ dm^3$ ක් සාදා ගැනිමට මුල් ද්‍රාවණයෙන් අවශ්‍ය පරිමාව සොයන්න.

60.

| ද්‍රාවණය | | ස්කන්ධය අනුව ප්‍රතිශතය | ද්‍රාවණයේ ඝණත්වය | මවුලික ස්කන්ධය |
|---|---|---|---|---|
| A | සාන්ද්‍ර හයිඩ්‍රොක්ලෝරික් ද්‍රාවණය | 73.001 | 1.08 | 36.5 |
| B | සාන්ද්‍ර සල්ෆියුරික් ද්‍රාවණය | 97.998 | 1.22 | 98.0 |
| C | සාන්ද්‍ර සෝඩියම් හයිඩ්‍රොක්සයිඩ් ද්‍රාවණය | 80.000 | 2.04 | 40.0 |

I. සාන්ද්‍රනය $0.5 \text{ mol dm}^{-3}$ වු තනුක HCl අම්ල ද්‍රාවණ 500 cm³ ක් පිලියෙල කිරීමට A ද්‍රාවණයෙන් කොපමන පරිමාවක් අවශ්‍යවේ ද?

II. $H^+$ අයන සාන්ද්‍රණය $0.25 \text{ mol dm}^{-3}$ වන අම්ල ද්‍රාවණ 500 cm³ ක් පිලියෙල කිරීමට B ද්‍රාවණයෙන් කොපමන පරිමාවක් අවශ්‍යවේ ද?

III. A ද්‍රාවණය 50 cm³ ක් හා B ද්‍රාවණය 50 cm³ ක් මිශ්‍ර කර ආස්‍රැත ජලය එකතු කර මුලු පරිමාව 500 cm³ ක් කරන ලදී. ලැබෙන අවසාන ද්‍රාවණයේ $H^+, Cl^-, SO_4^{2-}$ සාන්ද්‍රන සොයන්න.

IV. B ද්‍රාවණය 50 cm³ ක් හා C ද්‍රාවණය 50 cm³ ක් මිශ්‍ර කර ලැබෙන අවසාන ද්‍රාවණයේ $H^+$ අයන සාන්ද්‍රනය සොයන්න.

61. 2.00 moldm⁻³ NaOH හා 4.00 moldm⁻³ NaOH ද්‍රාවණ සපයා ඇත. මෙම ද්‍රාවණ උපයෝගි කරගෙන 3.00 moldm⁻³ NaOH ද්‍රාවණයකින් 500 cm³ ක් සාදාගන්නේ කෙසේද? (Na=23, O=16, H=1)

62. 0.1 moldm⁻³ $SrCl_2$ හා 0.1 moldm⁻³ $AlCl_3$ ද්‍රාවණ සපයා ඇත. මෙම ද්‍රාවණ උපයෝගි කරගෙන 0.25 moldm⁻³ $Cl^-$ වන ද්‍රාවණයකින් 500 cm³ ක් සාදාගන්නේ කෙසේද? (Sr=88, Al=27, Cl=35.5 )

63. 0.1 moldm⁻³ $FeSO_4$ , 40 cm³ ක් හා 0.4 moldm⁻³ $Na_2SO_4$ ද්‍රාවණ 60 cm³ ක් මිශ්‍රකර මුලු පරිමාව වන ද්‍රාවණයක් සාදාගන. එම ද්‍රාවණයේ $Fe^{2+}, Na^+, SO_4^{2-}$ ඒවායේ සාන්ද්‍රණ සොයන්න. (Fe=56, O=16, Na=23, S=32)

64. ද්‍රාවණයේ ඝණත්වය 1.5 g cm⁻³ හා ස්කන්ධය අනුව ප්‍රතිශතය - 98% වන $H_2SO_4$ ද්‍රාවණයකින් 15 cm³ කට ආස්‍රැත ජලය එකතු කර මුලු පරිමාව 100 cm³ වන ද්‍රාවණයක් සාදාගනි. එම ද්‍රාවණයෙ 60 cm³ ක් සමඟ ක්‍රියා කිරීමට 0.25 moldm⁻³ NaOH ද්‍රාවණයෙ අවශ්‍ය කරන පරිමාව සොයන්න. (Na=23, O=16, H=1, S=32)

65. සජල $Na_2CO_3 . 10\,H_2O$ 57.2 g කට ආස්‍රැත ජලය එකතු කර මුලු පරිමාව 150 cm³ වන ද්‍රාවණයක් සාදාගනි. $Na_2CO_3$ හි මවුලිකතාවය සොයන්න. (C=12, Na=23, O=16, H=1)

66. නිර්ජල NaOH 60 g කට ආස්‍රැත ජලය එකතු කර මුලු පරිමාව 100 cm³ වන ද්‍රාවණයක් සාදාගනි. NaOH හි මවුලිකතාවය සොයන්න. (Na=23, O=16, H=1)

67. ඝණත්වය 1.10 g cm⁻³ වන $C_6H_{12}O_6$ ද්‍රාවණයක මවුලීයතාවය 1.15 mol kg⁻¹ වේ. $C_6H_{12}O_6$ සාන්ද්‍රණය සොයන්න. (O=16, C=12, H=1)

68. 0.1 moldm$^{-3}$ $MgCl_2$ ද්‍රාවණයක් සපයා ඇත. මෙම ද්‍රාවණයේ ඝණත්වය 1.25 g cm$^{-3}$ නම් ද්‍රාවණයේ $MgCl_2$ මවුලීයතාවය සොයන්න. (Mg=24, Cl=35.5)

| | |
|---|---|
| pph - කොටස සියයක ඇති සංඝටකයේ කොටස් ගණන | = භාගය $\times 10^2$ |
| ppt - කොටස් දහසක ඇති සංඝටකයේ කොටස් ගණන | = භාගය $\times 10^3$ |
| ppm - කොටස් මිලියනයක ඇති සංඝටකයේ කොටස් ගණන | = භාගය $\times 10^6$ |
| ppb- කොටස් බිලියනයක ඇති සංඝටකයේ කොටස් ගණන | = භාගය $\times 10^9$ |

ජලීය ද්‍රාවණ සඳහා,
$1\, ppm = 1\, mg\, dm^{-3}$

69. භූ ජලයේ $5\, g$ ක් තුල $Zn^{2+}, Mn^{2+}$ හා $Fe^{2+}$ ප්‍රමාණය පිළිවෙලින් $0.05\, mg, 0.04\, mg$ හා $0.028\, mg$ ලෙස සඳහන් කර ඇත. භූ ජලයේ,

I. එක් එක් අයන සාන්ද්‍රනය $ppm$ වලින් සොයන්න.
II. එක් එක් අයන සාන්ද්‍රනය $mol\, dm^{-3}$ වලින් සොයන්න.

70. මවුල අනුපාතය 1:2 වන පරිදි $H_2SO_4$ හා HCl මිශ්‍රකර ආම්ලික ද්‍රාවණයක් සාදා ඇත. මෙම ද්‍රාවණයේ $H^+$ සාන්ද්‍රණය $6\, ppm$ නම්, ද්‍රාවණයේ

I. $H^+$ සාන්ද්‍රණය $mol\, dm^{-3}$ වලින් සොයන්න.
II. $Cl^-$ හා $SO_4^{2-}$ සාන්ද්‍රණ $mol\, dm^{-3}$ වලින් සොයන්න.
III. $Cl^-$ හා $SO_4^{2-}$ සාන්ද්‍රණ $ppm$ වලින් සොයන්න. (S=32, O=16, Cl=35.5 )

71. $Fe_2(SO_4)_3$ ද්‍රාවණයක් සපයා ඇත. මෙම ද්‍රාවණයේ $Fe^{3+}$ සාන්ද්‍රණය 112 ppm නම්, ද්‍රාවණයේ

I. $Fe^{3+}$ සාන්ද්‍රණය moldm$^{-3}$ වලින්
II. $SO_4^{2-}$ සාන්ද්‍රණය moldm$^{-3}$ වලින්
III. $SO_4^{2-}$ සාන්ද්‍රණය ppm වලින් සොයන්න. (Fe=56, O=16, S=32)

72. $Cr_2(SO_4)_3$ ද්‍රාවණයක් සපයා ඇත. මෙම ද්‍රාවණයේ $Cr^{3+}$ සාන්ද්‍රණය 208 ppm නම් ද්‍රාවණයේ

I. $Cr^{3+}$ සාන්ද්‍රණය moldm$^{-3}$ වලින්
II. $SO_4^{2-}$ සාන්ද්‍රණය moldm$^{-3}$ වලින්
III. $SO_4^{2-}$ සාන්ද්‍රණය ppm වලින් සොයන්න. (Cr=52, O=16, S=32)

73. මවුල අනුපාතය 3:2 වන පරිදි $SrCl_2$ හා $AlCl_3$ මිශ්‍රකර ද්‍රාවණයක් ඇත. මෙම ද්‍රාවණයේ $Cl^-$ සාන්ද්‍රණය 71 ppm නම් ද්‍රාවණයේ

I. $Cl^-$ සාන්ද්‍රණය moldm$^{-3}$ වලින්
II. $Sr^{2+}$ හා $Al^{3+}$ සාන්ද්‍රණ moldm$^{-3}$ වලින්
III. $Sr^{2+}$ හා $Al^{3+}$ සාන්ද්‍රණ ppm වලින් සොයන්න. (Sr=88, Al=27, Cl=35.5 )